# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2350/41 – 2023 සැප්තැම්බර් මස 20 වැනි බදාදා – 2023.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/03/2017/108.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.02.14 දිනැති හා අංක 2110/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙහිවල, කැරන් පෙදෙස, අංක 21 හි පදිංචි ඩී.ආර්.එස්. පෙරේරා මිය සහ කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 303 හි පිහිටි ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 11/ 2019 හා 2023.07.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 40368 – 18 (2023/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

යොමු අංකය : IR/COM/03/2017/108.
*නඩු අංකය:* A/11/2019.

ඩී.ආර්.එස් පෙරේරා මිය,
අංක 21 කැරන් පෙදෙස,
දෙහිවල.

*පළමු පාර්ශ්වය*

**එදිරිව**
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව,
අංක 303,
බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා වෘත්තීය සම්බන්ධතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019,02.07 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩු දුන් කාරණය :**
බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික අරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2019.01.23 වන දිනැතිව ඒවා ඇති ලිපියේ දැක්වෙන්නේ.

"ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ සේවය කළ ඩී.ආර්.එස්.පෙරේරා යන අය තමන් දැරූ තනතුරට අමතරව වැඩ බැලීමේ පදනමින් පිරිස් කළමනාකාර තනතුරෙහි රාජකාරි ඉටුකිරීම් වෙනුවෙන් වැඩ බැලීමේ දීමනාවක් ලබා නොදීම සාධාරණ සහ යුක්ති සහගත වන්නේද? එසේ නොවන්නේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද" යන්න පිළිබඳව වේ.

**පාර්ශ්වයන්ගේ ප්‍රකාශයන් :**
ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් තම පළමු විස්තර ප්‍රකාශය 2019.03.05 ඉදිරිපත්කර ඇති අතර වග උත්තරකාර පාර්ශ්වයද, සිය ප්‍රකාශය 2019.03.25 දින ඉදිරිපත් කර ඇති අතර පළමු පාර්ශ්වය සිය පිළිතුරු ප්‍රකාශය 2019.06.12 දින ඉදිරිපත්කර ඇත.

**පසුබිම සහ නඩු කාර්ය පටිපාටිය :**
2019.08.13 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ ඉහතකී දෙපාර්ශවයේම ප්‍රකාශන සහ ප්‍රති පිළිතුරු සැලකිරීම් වෙතද අවධානය යොමු කරමින් සමථයකට ඉඩකඩ ඇත්දැයි විමසා බලන ලදී. වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කරන ලද්දේ ඉහල කළමනාකරණය සමඟ සාකච්චා කර සමථයකට එළඹීමේ හැකියාවක් ඇත්නම් ඒ බව පසුව දන්වන බවයි. කෙසේ වුවද ඉදිරියේදී සමථයක් ඇතිකර ගැනීමට එළඹුනහොත් ඒ පිළිබඳව අගතියක් නොවන පරිදි නඩුව විභාගයට ගන්නා ලදී. ඒ අනුව පළමුවන පාර්ශ්වය මුලින්ම සිය මූලික සාක්ෂි ලබාදීම සිදු කරන ලදී.

2019.09.03 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේ පළමු පාර්ශවයේ සාක්ෂිකාරියගෙන් දීර්ඝ වශයෙන් හරස් ප්‍රශ්න විමසීම සිදු කරන ලදී. තව ද නැවත මෙම නඩුව 2019.10.15 දින කැඳවූ අවස්ථාවේ වැඩිදුර හරස් ප්‍රශ්න විමසීම සිදුකරන ලද අතර 2019.11.21 දින සාක්ෂිකාරියගෙන් නැවත ප්‍රශ්න විමසීම ද සිදුකරන ලදී .තව ද පළමු පාර්ශ්වය විසින් ඉල්ලා සිටින මුදල ගණනය කර ඉදිරිපත් කිරීමටද පළමු පාර්ශ්වය එකඟ වේ. 2020.01.30 දින ඉල්ලුම්කාරිය ඉදිරිපත්කර ඇති ගණනයන් පිළිබඳ නැවත මූලික ප්‍රශ්න විමසීම ද සිදුකරන ලදී.

2020.03.24 දින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකාර සහකාර සාමාන්‍යාධිකාරි මානව සම්පත් සාක්ෂි ලබාදීමට කැඳවන ලද අතර ඔහුගෙන් මූලික සාක්ෂි විමසීම සිදු කරන ලදී.

කෙසේ වුව ද රටේ පැවති කොවිඩ්( covid ) වසංගත තත්වය හේතුවෙන් නඩුව නැවත විභාගයට ගැනීම ප්‍රමාද වූ අතර 2021.03.25 දින නැවත විභාගයට ගන්නා ලද නමුත් සාක්ෂිකරුවන් කැඳවා ගැනීමේ අපහසුතාවයන් මත 2021.12.02 දිනට නැවත විභාගයට නියම කරන ලදී. එදින මුලින් සාක්ෂි ලබාදුන් වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරි පාලන සහ මානව සම්පත් යන අයගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුකරන ලදී.

කෙසේ වුව ද හරස් ප්‍රශ්න විමසීමෙන් පසුව මෙම නඩුවේ සමථයක් තිබේ ද යන්න විමසීමේ දී ඉල්ලුම්කාර පාර්ශ්වය වග උත්තරකාර ආයතනයට ගොස් සමථයක් සම්බන්ධයෙන් සාකච්චා කිරීමට එකඟත්වය පලකරන ලදී. ඒ අනුව සමථය හෝ විභාගය සඳහා නැවත ඇමතීම 2022.01.11 දිනට නියම විය. මෙදින අසනීප වීම හේතුවෙන් ඉල්ලුම්කාරිය නොපැමිණි අතර, සමථය හෝ විභාගය සඳහා 2022.02.25 දිනට නැවත මෙම නඩුවේ දින නියම කරන ලදී. එදින ද අසනීප හේතුවෙන් ඉල්ලුම්කාරිය නොපැමිණි අතර, සමථය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්චා කර තීරණයකට එළඹිය යුතු බව වගඋත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කරන ලදී.

කෙසේ වුව ද මෙම නඩුව විභාගයට ගැනීම ප්‍රමාදවීම වැළක්වීම පිණිස ඉදිරි කාලය තුළ සමථයක් ඇති වන්නේ නම් එයට අගතියක් නොවන පරිදි තවදුරටත් නඩු විභාගය සිදු කරන ලදී. මේ අනුව මෙදින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකාරියක් වන ලීලාද සිල්වා මහත්මියගෙන් මූලික සාක්ෂි විමසීම, හරස් ප්‍රශ්න විමසීම සහ නැවත ප්‍රශ්න විමසීම ද සිදුකර අවසන් කරන ලදී.

2022.03.24 දින නැවත නඩුව විභාගයට ගැනීමට දින නියම කළ ද වග උත්තරකාර පාර්ශ්වය කියා සිටින ලද්දේ සමථය පිළිබඳව අවසාන තීරණයක් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇති බැවින් සමථය ඉදිරිපත් කිරීමට දින ලබාදෙන ලෙසයි. 2022.04.27 දින නැවත ඇමතීම සිදු කළ ද වග උත්තරකාර පාර්ශ්වය නොපැමිණීම මත නඩුව විභාගයට ගැනීම නොහැකි විය. කෙසේ වුව ද රටේ පැවති අර්බුදකාරී තත්වයන් මත නඩුව විභාගයට ගැනීම ප්‍රමාද වූ අතර, 2022.11.29 දින කැඳවූ අවස්ථාවේ ද සමථයක් වාර්තා නොවූයෙන් නැවත නඩු විභාගය ආරම්භ වූ අතර පෙර දිනෙක සාක්ෂි විමසූ වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකාරියක් වන ලීලාවතී ද සිල්වා මහත්මියගෙන් වැඩිදුර හරස් ප්‍රශ්න විමසීම සිදුකරන ලදී. 2023.01.19 දින එකී සාක්ෂිකාරියගෙන් නැවත ප්‍රශ්න විමසීම ද සිදුකරන ලදී.

2023.01.24 දින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුවකු වන එකී ආයතනයේ පරිපාලන නිලධාරි පාලන සහ මානව සම්පත් යන අය සාක්ෂියට කැඳවන ලද අතර මූලික ප්‍රශ්න විමසීම්, හරස් ප්‍රශ්න විමසීම සහ නැවත ප්‍රශ්න විමසීම ද සිදු කරන ලදී.

කෙසේ වුව ද 2023.03.17 දින නැවත විභාගයට නියම කළ අවස්ථාවේ වග උත්තරකාර පාර්ශ්වය පූර්ණ සහ අවසාන සමථයක් වශයෙන් ඉල්ලුම්කාරියට රු. 367,636.98 ක මුදලක් ගෙවා පැමිණිල්ල සමථයකට පත්කර ගැනීමට සිය සමථ යෝජනාව ඉදිරිපත් කළ අතර, ඉල්ලුම්කාරියගේ අසනීප තත්වය ද සලකා බලා එකී සමථයට ඉල්ලුම්කාර පාර්ශ්වය ද එකඟ විය. තව ද එකී සමථ යෝජනාවට අධ්‍යක්ෂ මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ලැබුණු බව ද 2023.05.16 දිනැති ලිපිය මගින් බේරුම්කරණය වෙත දන්වා තිබිණි.

2023.05.26 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේ,

1. පූර්ණ සහ අවසාන සමථයක් වශයෙන් ඉල්ලුම්කාරිය වෙත මීට පෙර වැඩිපුර ගෙවා ඇති මුදල් අඩුකර රු. 367,636.98 ක මුදලක් ගෙවීමට වග උත්තරකාර පාර්ශ්වය එකඟ වූ අතර එලෙස එකී මුදල භාරගෙන පැමිණිල්ල සමතයකට පත්කර ගැනීමට ඉල්ලුම්කාර පාර්ශ්වය එකඟ විය.

2. තව ද ඉල්ලුම්කාරිය මේ සම්බන්ධයෙන් තව දුරටත් වග උත්තරකරුට විරුද්ධව පැමිණිල්ලක් හෝ නඩුකරයක් ඉදිරිපත් නොකරන බවට ද එකඟ විය.

3. තවද එකී මුදල 2023.06.07 දින ඉල්ලුම්කාරියට ගෙවීමට නියෝග කරන ලදී.

( පැමිණිලිකාරිය දැඩි ලෙස රෝගාතුරව සිටි බැවින් ඇයගේ උපදෙස් පරිදි ඇයගේ නීතීඥ මහතා විසින් එකී එකඟතාවයන්ට එළඹෙන ලදී.

ඉහත කී සමථ කොන්දේසිවලට එකඟ වෙමින් මෙම නඩුවේ දෙපාර්ශ්වය අතර සමථයක් සිදුවන ලදී.

ප්‍රදානය :

1. ඉහත කී එකඟත්වය පරිදි කටයුතු කිරීමට දෙපාර්ශ්වයට නියෝග කරමි.

2. මෙම සමථය සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත යොමු කළයුතු බවට නියෝග කරමි.

3. මෙම සමථය සාධාරණ වූත් යුක්ති සහගතවූත් එකක් බව තීරණය කරමි.

එච්. එම්. අනුලාවතී,
බේරුම්කරු.

2023 ජූලි මස 18 වැනි දින.

EOG 09 - 0191

---

මගේ අංකය: IR/COM/01/2020/237.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරයවන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.10.17 දිනැති හා අංක 2302/08 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කහතුඩුව, ප්‍රගති මාවත අළුත් පාර, අංක 421/සී/17 හි පදිංචි ඩබ්.කේ.ඒ.ඉන්දුමතී මිය ඇතුලු සේවක පිරිස සහ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234 හි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A58/2022 හා 2023.08.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ඩබ්.කේ.ඒ. ඉන්දුමතී මිය ඇතුලු සේවක පිරිස,
අංක 421/සී/17,
ප්‍රගති මාවත අළුත්පාර,
කහතුඩුව.

සහ

A /58/ 2022
1R /COM/01/2020/237

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත,
බත්තරමුල්ල.

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2022.10.06 දින දරන නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත් කර, මා වෙත යොමු කොට ඇත.

මෙම ආරාවුලට හේතුවී ඇති කරුණු වනුයේ,

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ නියුතු ඩබ්.කේ.ඒ. ඉන්දුමතී මිය ඇතුළු පහත නම් සඳහන් සේවක පිරිස පරිපාලන නිලධාරි (JM 1-2 (G-11) තනතුරට උසස් කිරීමේ දී උසස්වීම් ලබා දිය යුත්තේ කවද සිටද එකී දිනය සංශෝධනය කිරීම මගින් ඔවුනට අසාධාරණයක් සිදුව තිබේද ? යන්නත් එසේ නම් ඔවුනට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ.

1. ඩබ්.කේ.ඒ.ඉන්දුමතී
2. එන්.ඒ.එස්.නාකන්දල
3. ඩබ්.පුෂ්පකාන්ති
4. එම්.සී.වීරරත්න
5. එම්.එස්.මාරසිංහ
6. ජී.කේ.සී.දිල්රුක්ෂි
7. කේ.ආර්.සිරිවර්ධන
8. එම්.එස්.එන්.සමන්තා
9. කේ.එම්.ජී.ජී.ඩී.කේ.කෝණාර
10. එස්.ඒ.අබේරත්න
11. ඩබ්.ජී.සෝමාවතී
12. කේ.එම්.කේ.මැණිකේ
13. ඩී.ඒ.එස්.ආර්.සී.නවරත්න
14. එම්.ඩී.ඩී.බණ්ඩාරණායක
15. පී.එම්.ආර්.පතිරණ
16. කේ.ඩී.අනුර
17. එම්.එල්.එස්.ඩී.මැද්දේගොඩ
18. පී.ඒ.සමරසුන්දර
19. ආර්.ඩී.කේ.රූපසිංහ

ඒ අනුව මෙකී විභාගය
2022-10-14
2022-11-03
2022-11-18
2022-12-01
2022-12-15
2023-01-19
2023-02-02 දින 07 කැඳවා පවත්වාගෙන ගිය අතර මෙම ආරාවුලේ පැමිණිලි පාර්ශ්වය වශයෙන්,

මෙම ඉල්ලුම්කරුවන් පළමු පාර්ශ්වය ලෙසත් දෙවන පාර්ශ්වය ලෙස මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවා ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ලෙසත් ඉදිරිපත්වී ඇති අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ග්‍රේෂන් සිල්වා මහතාත් වග උත්තරකාර දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ මොහාන් සිල්වා මහතාත් පෙනී සිටී. මෙම ඉල්ලුම්කරුවන් ඉල්ලාසිටිනු ලබන්නේ තමන්ට අගතියක් වී ඇති 2012-04-05 දින සිට බලාත්මක වන පරිදි පරිපාලන නිලධාරී තනතුර පෙරදාතම් කරන ලෙස ප්‍රදානයක්ද/ එදින සිට ලැබිය යුතු හිඟ වැටුප් ලබාදීමේ ප්‍රදානයක්ද/ ගරු අධිකරණයට උචිතයැයි හැඟෙන වෙනත් සහනයක්ද වේ.

ඒ අනුව මෙම ඉල්ලුම්කරුවන්ගේ පැමිණිල්ල විභාගයට ගෙන දෙපාර්ශ්වීය පැහැදිලි කිරීම් අදල වූ වාර්තා ගොනු සටහන් ලේඛන ඉදිරිපත් කරමින් විභාගය පවත්වන ලදී. මෙහිදී දෙපාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න, පැහැදිලි කරගැනීමද විමසීමට භාජනය කරන ලදී. සාක්ෂි විමසීම් වලදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ වගකිව යුතු නිලයන්ද ඉදිරිපත්ව පැමිණිල්ලේ හරස් ප්‍රශ්න විමසීමට එකඟ විය. මේ කරුණු සම්පිණ්ඩනය කොට පැමිණිල්ලෙන් ඉල්ලා ඇති ප්‍රදානයන් ලබාදීම හෝ එය සාධාරණීකරණය කිරීම හෝ අගතියක් සිදුවී ඇත්නම් , එය ඉන් අගතියට පත් පාර්ශ්වයට සහනයක් ලබාදීමත් මෙහි ප්‍රධාන තීරණයේ පදනම විය.

එමෙන්ම දෙපාර්ශ්වීය නියෝජිත නීතිඥයින් සිය දයකත්වය මෙකී ඉදිරිපත්වූ කරුණු පැහැදිලි කර දී තම සේවා දයක පාර්ශ්වයට සුගතියක් කිරීම පිණිස කරුණු ඉදිරිපත් කිරීම ප්‍රදර්ශණය විය . එමෙන්ම බොහෝ අවශ්‍ය වාර්තා හා ලේඛන අධිකරණයට ඉදිරිපත් කලද වාර්තා අතර පැමිණිල්ල විසින් ඉල්ලා සිටි වාර්තා කිහිපයක් ඉදිරිපත් නොවීම ද නිරීක්ෂණය විය.

මෙහිදී පහත සඳහන් පරිදි මෙම අගතියට පත් පැමිණිලි පාර්ශ්වය මෙම විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයට බැඳුනු මුල් පත්වීම් දිනයන් වේ.

| මුල් පත්වීම් දිනය | නම |
|---|---|
| 1996-02-22 | 1. ඩබ්.කේ.ඒ.ඉන්දුමතී |
| 1995-09-20 | 2. එන්.ඒ.එස්.නාකන්දල |
| 1995-09-20 | 3. ඩබ්.පුෂ්පකාන්ති |
| 1995-09-20 | 4. එම්.සී.වීරරත්න |
| 1996-02-16 | 5. එම්.එස්.මාරසිංහ |
| 1995-08-14 | 6. ජී.කේ.සී.දිල්රුක්ෂි |
| 1992-06-05 | 7. කේ.ආර්.සිරිවර්ධන |
| 1995-09-20 | 8. එම්.එස්.එන්.සමන්තා |
| 1995-09-20 | 9. කේ.එම්.ජී.ජී.ඩී.කේ.කෝණාර |
| 1995-09-20 | 10. එස්.ඒ.අබේරත්න |
| 1995-09-20 | 11. ඩබ්.ජී.සෝමාවතී |
| 1996-08-01 | 12. කේ.එම්.කේ.මැණිකේ |
| 1997-10-01 | 13. ඩී.ඒ.එස්.ආර්.සී.නවරත්න |
| 1997-01-01 | 14. එම්.ඩී.ඩී.බණ්ඩාරනායක |
| 1995-12-14 | 15. පී.එම්.ආර්.පතිරණ |
| 1999-02-15 | 16. කේ.ඩී.අනුර |
| 1999-02-18 | 17. එම්.එල්.එස්.ඩී.මැද්දේගොඩ |
| 1999-02-17 | 18. පී.ඒ.සමරසුන්දර |
| 1999-05-17 | 19. ආර්.ඩී.කේ.රූපසිංහ |

සිය මූලික පත්වීමේ සිට ක්‍රමික උසස්වීම් ලබමින් ශ්‍රේණි උසස්වීම්වල මෙම නිලධාරීන් කණ්ඩායම සිය සේවා යෝජක කාර්යාංශය වෙත සේවා දායකත්වය සපයා තිබෙන බව නිරීක්ෂණය වූ අතර, ඉල්ලුම්කාර 19 දෙනාගේ කණ්ඩායම කාර්යාංශයේ අදාල S1 ශ්‍රේණියට උසස්වීමේ දිනය 2004-09-22 බවට වාර්තා විය.

ඒ අනුව මෙම පැමිණිලිකරුවන් සියලුදෙනාම කාර්යාංශයේ 2004 වසරේදී S1ශ්‍රේණියට උසස්කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමෙන් අනතුරුව 2004-09-22 සිට උසස්වීම් ලැබ සිය සේවා දයකත්වය සපයා තිබිණ. මෙසේ උසස්වීම් ලද මෙම පිරිස මෙම කාර්යාංශයේ පරිපාලන නිලධාරි තනතුර වන JM 2-1 (G-ii) ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුර සඳහා 2012 වසරේදී S1 ශ්‍රේණියට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ලෙස එවකට පැවති බඳවාගැනීමේ පරිපාටියට අනුව සම්මුඛ පරීක්ෂණයට ද ඉදිරිපත්ව ඇත. මෙකී වාර්තා හා පැහැදිලි කිරීම් මත සිදු වී ඇති පරිපාලන හා කළමනාකරණ දෝෂ අවසාන නිගමනයට පාදක කරගැනීමට සිදුවිය.

2012 වසරේ පැවති මෙම සම්මුඛ පරීක්ෂණයට S1 ශ්‍රේණියේ නිලධාරීන් 100 කට අධික ප්‍රමාණයක් ඉදිරිපත්ව පරිපාලනයේ අභිමතය පරිදි තෝරාගත් කොටසකට උසස්වීම් ලබා දී ඇති අතර, එසේ ලබා දී ඇති බව පැමිණිලි පාර්ශ්වය සිය පාර්ශ්වය වෙනුවෙන් අධිකරණයට දන්වා සිටියද දෙවන වග උත්තරකාර පාර්ශ්වය එම සම්මුඛ පරීක්ෂණ වාර්තා ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා පැමිණිලිකරුවන්ට අසාධාරණයක් ඇති වී බවට නිරීක්ෂණය වන්නේ 2015 වසරේ දුක් ගැනවිලි කමිටුව විසින් ද මෙනම ඉල්ලීම පිළිගෙන ඇති බවට නිරීක්ෂණය වූ බැවිණි.

මෙම පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති වාර්තා අනුව 2012 S1 ශ්‍රේණියට උසස්කිරීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයෙන් ද ඉදිරිපත්ව ඇති බව සේවා යෝජක කාර්යාංශයද පිළිගැනීමත්, මොවුන්ට ජොෂ්ඨත්වය හෝ අනිකුත් සුදුසුකම් සපුරා තිබියදී විධිමත් ලෙස පත්වීමක් ලැබීමට සුදුසුකම් තිබුණද පත්වීමක් නොලැබී ඇති බව ඔප්පු වී ඇති පැහැදිලි කිරීමක් විය.

මේ සඳහා දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත්කර ඇති ලේඛන වාර්තා හා සාක්ෂි අනුව,

1 ජනාධිපති කාර්යාලයේ 2016-12-21 දිනැති රාජ්‍ය ආයතනවල සේවක දිනයක් ප්‍රකාශයට පත් කිරීම 2017 යන ජනාධිපතිතුමාගේ නියෝගාත්මක ලිපිය හා උපදෙස් මාලාව අනුව 2017 වර්ෂයේ පළමු මාස 06 තුළ සේවක දිනයක් ප්‍රකාශයට පත්කරමින් සේවා අසාධාරණයක් වී ඇත්නම් සුදුසු සහන සැලසීම ක්‍රියාත්මක කිරීමට ලබාදී ඇත. මෙම උපදෙස් අනුව සේවක දුක්ගැනවිලි පදනම් කොට සේවක පිරිසෙහි කාර්යක්ෂමතාව හා ඵලදායී තෘප්තිමත් බවක් ඇතිකොට සේවක අභිප්‍රේරණය වැඩි කිරීම තුළින් ආයතනික සංවර්ධනය සහතික කිරීම එහි අරමුණ වී තිබිණි.

එම ලිපිය පාදක කර ගනිමින් 2017-03-01 දින විදේශ සේවා නියුක්ති කාර්යාංශ සභාපතිතුමාගේ අනුමැතිය ඇතිව පස්දෙනෙකුගෙන් සමන්විත විවිධ කරුණු විභාගයට කමිටු 4 ක් පත් කර ඇත. සේවක බඳවාගැනීම්, උසස් වීම් හා ස්ථිර කිරීම් ඉන් එක් කමිටුවක විෂය පථය විය. එම කමිටුව විසින් සේවක දුක්ගැනවිලි කරුණු 36 ක පැමිණිලි විමසා බලා එම නිර්දේශය රේඛීය අමාත්‍යංශ ලේකම්වරයාට යවා ඇත. ඒ අනුව රේඛීය අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් ඔහුගේ 2018-10-04 වෙනි දින එම නිර්දේශය අනුමත කර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලබාදී ඇත.

මෙකී අනුමැතිය අනුව කාර්යාංශයේ සභාපතිවරයා විසින් එම පැමිණිලිකරුවන් 19 දෙනා වෙත AD/02/226 අංක දරන හා 2019.01.22 දිනැති ලිපිය මගින් 2012.04.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි JM 2-1 (G-ii) ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරට උසස් කර ඇති බව දන්වා ඇති අතර තනතුරට අදාළ වැටුප් පරිමාණයන් හා වැටුප් පියවරයන් ඇතුලත් විධිමත් උසස්කිරීමේ ලිපිය පසුව නිකුත් කරන බවට එහි සඳහන් කර ඇත. එසේම මෙම ලිපිය අනුව 2019.01.22 පසු දිනක එනම් 2019-03-01 දින අංක AD/02/226 දරන ලිපි මගින් එම සේවකයින් වෙත විධිමත් පත්වීම් ලිපියක් මගින් මුල් පත්වීමේ දිනය 2018-10-04 දින වශයෙන් සංශෝධනය කොට ලබා දී ඇත. ඒ අනුව එම පත්වීම් ලිපියෙන් මුලින් ලබා දී තිබූ පත්වීම් දිනය පසුදතම් කර ඇත.

2 මෙසේ පත්වීමේ දිනය සංශෝධනය කිරීමට හේතු වශයෙන් දක්වා ඇත්තේ විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී භාණ්ඩාගාර නියෝජිත විසින් ලබාදෙන ලද උපදෙස් අනුව බව වග උත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ඉදිරිපත් කිරීමේදී තහවුරු කර ඇත.

එකී ඉදිරිපත්කිරීම එම මස 11 වැනි දිනයේ පැවති රැස්වීමක තීරණය මත සිදුවූ බවයි. එසේ වුවද පත්වීම් දිනය පෙරදතම් කරන ලිපිය එම මස 01 දිනට අදළ වන බව එම පත්වීම් ලිපි පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වේ. එසේ හෙයින් පත්වීමේ දින සංශෝධනය කරමින් ඉදිරිපත් කරන ලද ලිපියේ දිනට දින ගණනාවකට පසුව එළැඹි රැස්වීමක තීරණයක් මත සිදුකළා යැයි කීම, ඉදිරිපත්කිරීම, පිළිගත නොහැකි, සිදුවිය නොහැකි කරුණක් බව පැහැදිලි වේ.

3 මෙම මාර්තු 01 දිනැති විධිමත් පත්වීම් ලිපියේ සඳහන් පත්වීමේ දිනය සංශෝධනය කිරීමට සිදුවූ හේතු හෝ විස්තර පිළිබඳව මෙකී ඉල්ලුම්කාර පාර්ශ්වය දැනුවත් කර නොමැති වීමත් , ඔවුන්ට ඒ පිළිබඳව නොදැන්වීමත් පැමිණිලිකරුවන්ගේ පාලනයෙන් බැහැරව සිදුවූ බරපතල වරදක් සහ අසාධාරණයක් ලෙස පැහැදිලි වේ.

4 මෙකී පත්වීම් සඳහා 2015 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව අවස්ථා දෙකකදී පත්වීම නොලද මෙම ඉල්ලුම්කාර මෙකී පිරිසට අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි, පසුව පිහිටුවන ලද දුක්ගැනවිලි කමිටුවක් හරහා කරන ලද පරීක්ෂණයේ දී ඔවුනට අගතියක් සිදුවී ඇති බවට සලකා සහනයක් සලසා දීමේ අභිලාෂයෙන් පත්කළ එම කමිටුව විසින් කරන ලද නිර්දේශය පාදක කරගෙන මෙම පත්වීම 2004-09-22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙරදතම් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

4.I එසේ පත්වීම පෙරදතම් කර ලබාදුන් කමිටු නිර්දේශය සහිත කමිටු වාර්තාව නිරීක්ෂණය කිරීමේදී මෙම ඉල්ලුම්කරුවන් 19 දෙනා වෙත එම පත්වීම පෙරදතම් කොට ලබාදීමට නිර්දේශ කර ඇත්තේ "මොවුන් S-1 තනතුරේ වසර 10 ක සේවාකාලය සම්පූර්ණකර ඇත්නම් මෙකී පත්වීම හිඟ වැටුප් රහිතව ලබා දීම සුදුසු බවටය." එමනිසා මෙකී පත්වීම මෙම ඉල්ලුම්කරුවන් S-1 තනතුරට පත්වූ දිනයේ සිට වසර 10 ක් ගතවන දිනය සිට එම වසර 10 සම්පූර්ණ වන දිනයට පරිපාලන නිලධාරී තනතුරේ JM 2-1 වැටුප් පරිමාණයේ තනතුරට පත්වීම ලබාදීම කළ යුතුව ඇත.

4.II එසේම එම පත්වීමේ දිනය පෙරදතම් වීම මත කිසිඳු හිඟ වැටුපක් ගෙවීමට කමිටුව නිර්දේශ කර නොමැති නිසා හිඟ වැටුපක් ගෙවීමද සුදුසු නැත.

5 මෙම ඉල්ලුම්කරුවන් කර ඇති ඉල්ලීමේ සාධාරණත්වය යුක්ති යුක්ති කිරීම ඉල්ලුම්කාර පාර්ශ්වයට සිදුවී ඇති අසාධාරණයට සහනයක් කර දීම මෙම පරීක්ෂණයේදී තීරණය කිරීම ඉතා වැදගත් වේ.

5.I මන්දයත් 2012 සමමුඛ පරීක්ෂණය අනුව 2015 දුක්ගැනවිලි කමිටු නිර්දේශය මත 2012-04-05 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබාදී ඇති උසස්වීම 2019-03-01 හා AD/02/226 දරන ලිපියෙන් 2018-10-04 ලෙස පසුදතම් කිරීම පළමු පාර්ශ්වයට වූ අගතියක් බව නිරීක්ෂණය කරමි.

5.II එසේම එය එකම සහපතිවරයෙකුගේ අත්සනින් යුත් ලිපියකින් ලබා දීම චර්යාත්මක නොවන බවද පැහැදිලි වේ.

6 එසේම, මෙම ඉල්ලුම්කරුවන් විසින් කර ඇති පත්වීම පෙරදතම් කිරීම සංශෝධනය කිරීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන බලපාන බව දෙවැනි පාර්ශ්වය විසින් තර්කනය කළද දෙවැනි වරටද මොවුනට ලබාදෙන පත්වීම් ලිපියෙන්ද ,

6.I මීට පෙරදී මෙම සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුවම වෙනත් කණ්ඩායමකට ලබාදී ඇති පත්වීම පෙරදතම් කර තිබීමෙන්ද, එම විධිවිධාන මෙම අයගේ පත්වීම්වලට අදළ තීරණයට බලපාන පූර්වාදර්ශ බවට පැහැදිලි වේ. මෙය මෙම පත්වීම්වල ඇති ගැටළු සහගත තත්වය, කාර්යංශයේ පරිපාලන දුර්වලතා බවත්, අවිධිමත් බවත් වගකීමෙන් තොරවූ බවත් නිසා එය මෙම පැමිණිලිකරුවන්ගේ පාලනයෙන් බැහැර ඔවුනට වූ අසාධාරණයක් බව නිරීක්ෂණය කරමි.

6.II මෙම පළමු පාර්ශ්වය කිසිදු විනය විරෝධී ක්‍රියා හෝ රාජකාරි පැහැරහැරීම් සිදු නොකළ ඉතා හොඳ කාර්යය සාධනයකට ලක්වූ සේවා පළපුරුදු නිලධාරීන් බවට ඉදිරිපත් කර ඇති සාක්ෂි සහ වාර්තා අනුව පළමු පාර්ශ්වය මෙම කාර්යාංශයට වැදගත් වන සේවක පිරිසක් බව නිරීක්ෂණය කරමි.

6.III මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛන අනුව බඳවාගැනීම්, උසස්කිරීම් හා ස්ථිර කිරීම් සම්බන්ධයෙන් පිහිටුවන ලද දුක්ගැනවිලි කමිටුවේ තීරණය අනුව මෙහි පළමු පාර්ශ්වයට අසාධාරණයක් වී ඇති බවට කළ නිගමනය පරිදි මොවුනට සිය උසස්වීම ලබා නොදීම ඔවුනට සිදුවූ අගතියක් බවද නිරීක්ෂණය කරමි.

ප්‍රදානය

I. මේ අනුව මෙම පළමු පාර්ශ්වයේ ඩබ්.කේ.ඒ.ඉන්දුමතී ඇතුළු දහනවදෙනා වෙත 2014-09-22 දින සිට ක්‍රියාත්මක වන පරිදි JM 1-2 G-2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිපාලන නිලධාරි තනතුරට උසස් කිරීම,

II. මෙම තනතුර අදළ අයට පෞද්ගලික වනසේ ලබාදීම,

III. උසස්වීම ක්‍රියාත්මක දින සිට අදළ වැටුප් පරිමාණයේ පිහිටුවා හිඟ වැටුප් නොගෙවීම,

IV. කෙසේ නමුත් මොවුනට සිදුවී ඇති අගතියට සහනයක් ලෙස මොවුන්ගේ උසස්වීම් පත්වීම ක්‍රියාත්මක වන 2014-09-22 දින පටන් සාධාරණ ප්‍රදානයක් ලෙස මසකට රු. 1,000/- බැගින් වසරකට රු. 12,000/- බැගින් ගෙවීමට තීරණය කරමි .

| *අනු. අංකය* | | *2014-09-22 සිට 2023-09-22 දක්වා ගෙවිය යුතු වන්දි මුදල රු.* | |
|---|---|---|---|
| 01 | කේ.ආර්.සිරිවර්ධන | 12,000 X 09 | 108,000.00 |
| 02 | ජී.කේ.සී.දිල්රුක්ෂි | 12,000 X 09 | 108,000.00 |
| 03 | එම්.එස්.එන්.සමන්තා | 12,000 X 09 | 108,000.00 |
| 04 | කේ.එම්.ජී.ජී.ඩී.කේ.කෝණාර | 12,000 X 09 | 108,000.00 |
| 05 | එස්.ඒ.අබේරත්න | 12,000 X 09 | 108,000.00 |

| අනු අංකය | නම | 2014-09-22 සිට 2023-09-22 දක්වා ගෙවිය යුතු වන්දි මුදල | රු. |
|---|---|---|---|
| 06 | ඩබ්.ජී.සෝමාවතී | 12000 X 09 | 108,000.00 |
| 07 | එන්.ඒ.එස්.නාකන්දල | 12000 X 09 | 108,000.00 |
| 08 | ඩබ්.පුෂ්පකාන්ති | 12000 X 09 | 108,000.00 |
| 09 | එම්.සී.වීරරත්න | 12000 X 09 | 108,000.00 |
| 10 | පී.එම්.ආර්.පතිරණ | 12000 X 09 | 108,000.00 |
| 11 | එම්.එස්.මාරසිංහ | 12000 X 09 | 108,000.00 |
| 12 | ඩබ්.කේ.ඒ.ඉන්දුමතී | 12000 X 09 | 108,000.00 |
| 13 | කේ.එම්.කේ.මැණිකේ | 12000 X 09 | 108,000.00 |
| 14 | එච්.ඩී.ඩී.බණ්ඩාරණායක | 12000 X 09 | 108,000.00 |
| 15 | ඩී.ඒ.එස්.ආර්.සී.නවරත්න | 12000 X 09 | 108,000.00 |
| 16 | කේ.ඩී.අනුර | 12000 X 09 | 108,000.00 |
| 17 | පී.ඒ.සමරසුන්දර | 12000 X 09 | 108,000.00 |
| 18 | ආර්.ඩී.කේ.රූපසිංහ | 12000 X 09 | 108,000.00 |
| 19 | එම්.එල්.එස්.ඩී.මැද්දේගොඩ | 12000 X 09 | 108,000.00 |
| | | | **2,052,000.00** |

ඒ අනුව රු 2,052.000.00 (විසිලක්ෂ පනස් දෙදහස) ක මුදලක් මෙම ප්‍රදානය ගැසට්ගත කිරීමෙන් මසක් ඇතුලත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන මෙන් ද අනෙකුත් තීරණයන් ක්‍රියාත්මක කරන ලෙසද වග උත්තරකාර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට නියෝග කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

2023.08.31

සරත් චන්ද්‍රසිරි විතාන,
බේරුම්කරු.

EOG 09 – 0192

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.